**24-10-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, බාබා ඔබට නිවහනට මාර්ගය පෙන්වීමට ඇවිත්. ඔබ ජීව අවධානයෙන් සිටින විට, ඔබට මෙම පහසු මාර්ගය දැකිය හැක.

**ප්‍රශ්නය:** ස්වර්ණමය යුගී දේවතාවන් බැඳීම් ජයගත් අය ලෙස හැඳින්වීමට, සංගම යුගයේදී ඔබට ලැබෙන ඥානය කුමක්ද?

**පිළිතුර:** සංගම යුගයෙදී පරම පියා ඔබට අමරණීයත්වයේ කතා පුවත පවසා, ඔබට සදාතනික ජීවාත්ම ගැන දැනුම ලබා දෙයි. මෙය අවිනාශී, කල් තියා නියමිත වූ, නාටකයක් බවත්, සෑම ජීවාත්මයක්ම තමන්ගේම චරිත කොටස රඟපාන බවට දැනුමත් ඔබට ලැබෙනවා. ජීවාත්මයක් තම සිරුර හැර දමා තවෙකක් ගනී. එබැවින් හැඬීමට අවශ්‍ය නැත. ස්වර්ණමය යුගී දේවතාවන් බැඳීම් ජය ගත් අය ලෙස හැඳින්වෙන්නේ, ජීවාත්මයන්ට මෙම ඥානය දැන් ලැබීමෙනි. එහිදී, මරණය පිළිබඳ සඳහනක් නැත. ඔවුන් තම පැරණි සිරුරු සතුටින් හැර දමා අළුත් ඒවා ගනී.

**ගීතය:** අහෝ දෙවියනේ, අන්ධයින්ට මාර්ගය පෙන්වන්න!

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, මිහිරිතම ආධ්‍යාත්මික දරුවන්ට පවසන්නේ : මා ඔබට මාර්ගය පෙන්වනවා, නමුත් ප්‍රථමයෙන් තමන් ජීවාත්ම බව සලකන්න. ජීව අවධානයෙන් අසුන් ගන්න, එවිට ඔබට මෙම මාර්ගය පහසු බව දැනෙයි. ඔබ භක්ති මාර්ගයේ කල්ප භාගයක් වැටි වැටි ගමන් කලා. භක්ති මාර්ගයේ විශාල මෙවලම් ප්‍රමාණයක් තිබේ. සිටින්නේ එක අසීමිත පියා පමණක් බව, පරම පියා දැන් පහදා දී තිබෙනවා. පරම පියා පවසන්නේ මා ඔබට මාර්ගය පෙන්වනවා. ඔහු පෙන්වන මාර්ගය කුමක්ද කියාවත්, ලෝකයේ කිසිවෙකු නොදනී. එය මුක්තිය සහ ජීවන-මුක්තියට මාර්ගයයි මුක්තිය සහ විමුක්තිය. සාම දේශය, මුක්තිය ලෙස හැඳින්වෙයි. සිරුරක් නොමැතිව ජීවාත්මයකට කතා කල නොහැක. ශබ්දයක් නැගිය හැක්කේ මෙම ඉන්ද්‍රියයන් තුලින් පමණයි. ශබ්දයක් නිපදවන්නේ මුඛයක් තුලිනි. මුවක් නොතිබුනේ නම්, ශබ්දය එන්නේ කොහෙන්ද? ජීවාත්මයන්ට මෙම ඉන්ද්‍රියයන් ලැබෙන්නේ ක්‍රියා කිරීමටයි. රාවනගේ රාජධානියේ ඔබ සිදු කරන්නේ පාපකාරී ක්‍රියාවන්ය. එම පාපකාරී ක්‍රියා ඉතාම අපිරිසිදු ක්‍රියාය. ස්වර්ණමය යුගයේ රාවන නොමැත. එබැවින් ක්‍රියා අකර්මය. එහි පාපයන් පහ නොමැත. එය දිව්‍යලෝකය ලෙස හැඳින්වෙයි. භාරතයේ වැසියන්, දෙව්ලොව වැසියන්ව සිටි නමුත් ඔවුන් දැන් අපායේ වැසියන් ලෙස හැඳින්වෙයි. ඔවුන් විෂ ගංගාවේ ගිලෙමින් සිටියි. ඔවුන් සියළු දෙනාම එකිනෙකාට දුක ඇති කරයි. ඔවුන් පවසන්නේ බාබා, දුක පිලිබඳ සඳහනක් නොමැති තැනකට අපව ගෙන යන්න. භාරතය දිව්‍යලෝකයව පැවති කල්හි, දුක පිලිබඳ සඳහනක් නොවීය. ඔවුන් දෙව්ලොව සිට අපායට පැමිණියා. දැන් ඔවුන් දෙව්ලොවට යා යුතුයි. මෙය නාටකයකි. පියාම මෙහි අසුන් ගෙන ඔය දරුවන්ට විස්තර කර දෙයි. මෙය සත්‍යයේ, සත්‍ය ඇසුරයි (සත්සංග). ඔබ සිහි කරන්නේ සත්‍ය පියාවයි. උසස්ම උසස් දෙවියන් ඔහුම පමණයි. නිර්මාණකරු ඔහුයි. ඔබට ඔබගේ උරුමය ලැබෙන්නේ ඔහුගෙනි. පියාම ඔය දරුවන්ට ඔබගේ උරුමය ලබා දෙයි. ඔවුන්ට සීමිත පියවරු සිටියත් ඔවුන් ඔහු සිහිකර මෙසේ පවසයි අහෝ දෙවියනේ, අහෝ පරම පියාණෙනි, පරමාත්ම ජීවය, අනුකම්පා කල මැන! භක්ති මාර්ගයේ බොහෝ වැටි වැටි ගමන් කිරීමෙන් ඔවුන් අසහනයට පත්ව සිටියි. ඔවුන් පවසන්නේ අහෝ බාබා, අපට සතුටේ සහ සාමයේ අපගේ උරුමය ලබා දෙන්න! මෙය ලබා දිය හැක්කේ පියාට පමණක් වන අතර එයත් උපත් 21 කටයි. ඔබට මෙය ගණනය කල හැක. ස්වර්ණමය යුගයේ, එය ඔවුන්ගේ රාජධානිය වූ කල, අනිවාර්යෙන් අඩු ජනගහණයක් සිටින්නට ඇති. තිබුණේ එක් ධර්මයක් සහ එක් රාජධානියක් පමණයි. එය දිව්‍යලෝකය, සතුටු දේශය ලෙස හැඳින්වෙයි. නව ලෝකය, සතෝප්‍රධාන් (සම්පූර්ණයෙන් පිවිතුරු) බව කියයි. පැරණි ලෝකය තමෝප්‍රධාන් (සම්පූර්ණයෙන් අපවිත්‍ර) ලෙස හැඳින්වෙයි. සෑම දෙයක්ම පලමුව සතෝප්‍රධාන් වන අතර පසුව එය සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව තුලින් යයි. කුඩා දරුවන් සතෝප්‍රධාන් ලෙස හඳුන්වයි. කුඩා දරුවන් මහා ආත්මයන්ට (ශ්‍රේෂ්ඨ ජීව) වඩා ශ්‍රේෂ්ඨ බව කියයි. මහාත්මයන්, ඉපදී, වැඩී, පාපයන් අත්විඳ ඉන්පසුව නිවෙස හැර යයි. කුඩා දරුවන් පාපයන් ගැන කිසිවක් නොදනී ඔවුන් සම්පූර්ණයෙන් අහිංසකයි. ඔවුන් මහාත්මයන්ට වඩා ශ්‍රේෂ්ඨ බව කියන්නේ මේ නිසයි. දේවතාවන්ට ප්‍රශංසා කරන්නේ සියළු ගුණදම් වලින් සපිරි කියාය. සාදූන්ට මෙම ප්‍රශංසාව කිසි විටෙක නොකරයි. පරම පියා,

හිංසනය සහ අවිහිංසාවේ අරුත පහදා දී තිබේ. කෙනෙකුට පහර දීම හිංසනය වෙයි. විශාලතම හිංසනය වන්නේ රාග අසිපත භාවිතා කිරීමය. දේවතාවන් අවිහිංසකයි. ඔවුන් කාම අසිපත භාවිතා නොකරයි. පරම පියා පවසන්නේ මා දැන් පැමිණ සිටින්නේ ඔබව මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කිරීමටයි. දේවතාවන් සිටින්නේ දෙව්ලොවයි. මෙහි කිසි කෙනෙකුට තමන්ව දේවතාවක් ලෙස හැඳින්විය නොහැක. සෑම කෙනෙකුටම වැටහෙන්නේ තමන් පහත්, දූෂිත පාපතරයෙක් බවයි. එබැවින් තමන්ව දේවතාවක් ලෙස ඔවුන් හඳුන්වන්නේ කෙසේද? ඔවුන් එය හින්දු ආගම ලෙස හැඳින්වූයේ ඒ නිසයි. ඇත්ත වශයෙන්ම එය ආදි සනාතන දෙව් දේවතා ධර්මය විය. ‘හින්දු‘ යන වචනය හටගත්තේ ‘හින්දුස්ථාන්‘ යන වචනයෙනි, එබැවින් ඔවුන් එය හින්දු ආගම ලෙස හඳුන්වයි. ඔබ පවසන්නේ ඔබ දේවතා ධර්මයෙන් බව වුනත් ඔවුන් ඔබව ඇතුලත් කරන්නේ හින්දු ආගම යටතේ ඇති තීරුවේය. ඔවුන්ට තීරුවක් තිබෙන්නේ හින්දු ආගමට පමණක් බව ඔවුන් කියයි. අපවිත්‍ර වීම නිසා ඔවුන්ගෙන් කිසිවෙකුට තමන්ව දේවතාවන් ලෙස හැඳින්විය නොහැක. ඔබ වන්දනීය දේවතාවන්ව සිටි බවත් දැන් පූදන්නන් බවට පත් වී ඇති බවත් ඔබට දැන් වැටහෙයි. පෙර, ඔබ ශිවාගේ අමිශ්‍ර වන්දනාවේ යෙදුනා. පසුව ඔබ මිශ්‍ර වූ පූදන්නන් විය. පරම පියා ඒකායන කෙනාය. ඔබට ඔබගේ උරුමය ලැබෙන්නේ ඔහුගෙනි. බොහෝ විවිධ දේවතා වර්ග ආදි සිටියි. ඔවුන්ගෙන් ඔබට කිසිම උරුමයක් ලැබෙන්නේ නැත. ඔබට මෙම බ්‍රහ්මගෙන් පවා උරුමය හිමි වන්නේ නැත. එක්කෙනෙක් අශාරීරික පියා වන අතර අනෙක් කෙනා ඔබගේ භෞතික පියාය. ඔවුන්ට භෞතික පියවරුන් සිටියත් ඔවුන් නොකඩවා පවසන්නේ අහෝ දෙවියනේ! ඔබගේ භෞතික පියාට ඔබ එසේ නොකියයි. උරුමයක් ලැබෙන්නේ පියෙකුගෙන්ය. සැමියෙක් සහ බිරිඳක් අර්ධ හවුල්කරුවන්ය. එබැවින් ඇයට සෑම දේකින්ම අඩක් ලැබිය යුතුයි. පලමුව ඇගේ කොටස ලෙස අඩක් ලබා දිය යුතු අතර ඉන්පසුව දරුවන්ට අනෙක් භාගය ලබා දිය යුතුයි. කෙසේවෙතත් මෙකල සියළුම ධනය දරුවන්ට ලබා දෙයි. සමහරුන්ට බොහෝ බැඳීම් තිබේ. ඔවුන් මිය ගිය පසු, සියළු අයිතීන් තිබෙන්නේ දරුවන්ට කියා, ඔවුන් සිතයි. පියාගේ අභාවයෙන් පසුව, වත්මන් දරුවන් ඔවුන්ගේ මව ගැන විමසන්නේ වත් නැත. සමහරු තම මවට ආදරය කරයි. කෙසේනමුත් සමහරු තම මවට විරුද්ධ වෙයි. මේ දිනවල වැඩි දෙනෙක් තම මව ගැන විමසන්නේ නැත. ඔවුන් තම සියළු ධනය අපතේ හරියි. සමහර හදාගත් දරුවන්ද එවැනිය. ඔවුන් තම මවට බොහෝ කරදර කරයි. ඔය දරුවන් ගීතයට සවන් දුන්නා. ඔවුන් පවසන්නේ බාබා අපට දැන් විවේකය ඇති, සතුට වෙතට මාර්ගය පෙන්වන්න. රාවනගේ රාජධානියේ සතුට නොමැත. ශිවා, ශංකර්ගෙන් වෙනස් බව, භක්ති මාර්ගයේ අයට වැටහෙන්නේ නැත. ඔවුන් නොකඩවා තම හිස නැමීම සහ ග්‍රන්ථ කියවීම සිදු කරයි. හොඳයි, ඔබට ඉන් ලැබෙන්නේ කුමක්ද? ඔවුන් කිසි දෙයක් නොදනී. සියළු දෙනාටම සාමය සහ සතුට දානය කරන්නේ ඒකායන පියා පමණයි. සත් යුගයේ සතුට මෙන්ම සාමයද තිබේ. භාරතයේ සතුට සහ සාමය තිබුනු නමුත් ඒවා තව දුරටත් නොපවතී. මේ නිසයි ඔවුන්ගේ භක්තියේදී ඔවුන් දොරින් දොරට වැටි වැටි යන්නේ. ඔබව සාම දේශයට සහ සතුටු දේශයට ගෙන යන්නේ ඒකායන පියා පමණක් බව, ඔබට දැන් වැටහෙයි. බාබා, අප සිහි කරන්නේ ඔබව පමණයි. අපගේ උරුමය අප හිමි කරගන්නේ ඔබගෙන් පමණයි. පරම පියා පවසන්නේ ඔබ තම සිරුරු සහ ශාරීරික නෑදෑයින් අමතක කල යුතුයි. ඒකායන පියා පමණක් සිහි කරන්න! ඔය ජීවාත්ම පිවිතුරු විය යුත්තේ මෙහිදීය. ඔබ ඔහුව සිහි නොකරන්නේ නම්, ඔබට දඬුවම් විඳීමට සිදු වෙයි. ඔබගේ තත්ත්වය අඩු වෙයි. මේ නිසයි පරම පියා පවසන්නේ සිහිපත් කිරීමේ සිටීමට උත්සාහ දරන්න. ඔහු විස්තර කරන්නේ ඔය ජීවාත්මයන්ටයි. ‘ආධ්‍යාත්මික දරුවනේ‘ කියා පවසන වෙනත් සත්සංග ආදිය නොමැත. මෙය, ඔය දරුවන්ට ආධ්‍යාත්මික පියාගෙන් ලැබෙන ආධ්‍යාත්මික ඥානයයි. ‘ආත්මය‘ යනු අශාරීරික බවයි. ශිවාද අශාරීරිකයි. ඔය ජීවාත්ම තිත්ය ඔබ ඉතාමත්ම කුඩාය. දිව්‍යමය දර්ශනයක් නොමැතිව, කිසිවෙකුට ජීවාත්මයක් දැකිය නොහැක. දිව්‍යමය දර්ශන ලබා දෙන්නේ පරම පියා පමණයි. බැතිමතුන් අසුන්ගෙන හනුමාන්, ගනේශ් ආදීන්ව වන්දනා කරයි. දැන් ඔවුන්ට ඒ අයගේ දර්ශන ලැබෙන්නේ කෙසේද? පරම පියා පවසන්නේ දිව්‍යමය දර්ශන පිරිණමන්නා මමයි. බොහෝ භක්තියේ යෙදී ඇති අයට දර්ශන ලබා දෙන්නේ මමයි. කෙසේවෙතත් ඒවායින් කිසිම ඵලක් නැත. සිදුවන්නේ ඔවුන් සතුටු වීම පමණයි. ඉන්පසුවද ඔවුන් නොකඩවා පාපයන් සිදු කරයි. ඔවුන්ට කිසිම ලැබීමක් හිමි වන්නේ නැත. ඉගෙන නොගෙන ඔවුන් යම් කෙනෙක් බවට පත් වන්නේ කෙසේද? දේවතාවන් ගුණධර්ම වලින් පිරිපුන්ය. ඔබද ඔවුන් මෙන් විය යුතුයි. ඉතිරි සියල්ල භක්ති මාර්ගයේ දර්ශනය. ඔබ සැබවින්ම ක්‍රිෂ්ණා සමඟ ඔංචිල්ලා පැද ඔහු සමඟ දිව්‍ය ලෝකයේ හිඳිවි. එය රඳා පවතින්නේ ඔබ ඉගෙන ගන්න ප්‍රමාණය මතය. ඔබ ශ්‍රීමත් අනුගමනය කරන ප්‍රමාණයට අනුව, ඔබ උසස් තත්ත්වයක් හිමිකර ගනිවි. ශ්‍රීමත් ලබා දෙන්නේ පරමාත්ම දෙවියන්ය. එය ක්‍රිෂ්ණාගේ ශ්‍රීමත් ලෙස ඔබ හඳුන්වන්නේ නැත. ක්‍රිෂ්ණා ජීවය ඔහුගේ තත්ත්වය හිමි කරගත්තේ, පරම පියා, පරමාත්ම ජීවයගේ ශ්‍රීමත් අනුගමනය

කිරීමෙන්ය. ඔය ජීවාත්මද දේවතා ධර්මයේ සිටියා. වෙනත් වචන වලින් කියන්නේ නම්, ඔබ සිටියේ ක්‍රිෂ්ණාගේ රජ පෙලපතේය. රාධේ සහ ක්‍රිෂ්ණා අතර සම්බන්දකම කුමක්ද කියා, භාරත ජනතාව නොදනී. ඔවුන් දෙදෙනා වෙනස් රාජධානි දෙකකින් පැවත එයි. විවාහයෙන් පසුව, ඔවුන් ලක්ෂ්මී සහ නාරායන් වෙයි. පරම පියා පැමිණ සිටින්නේ මේ සියළු දේ විස්තර කිරීමටයි. ඔබ දැන් ඉගෙන ගන්නේ දෙව්ලොව රජකුමර කුමරියන් වීමටයි. ඔවුන්ගේ නම් වෙනස් වන්නේ, රජ කුමරාගේ සහ රාජකුමාරිකාවගේ විවාහය වෙලාවේය. එබැවින් පරම පියා ඔය දරුවන්ව, එවන් දේවතාවන් බවට පත් කරයි. කෙසේවෙතත්, ඒ ඔබ පියාගේ ශ්‍රීමත් අනුගමනය කරන්නේ නම් පමණයි. ඔබ මුඛයෙන් උපන් දරුවන්ය. ඔවුන් උපදින්නේ මව් කුසකින්ය. ඒ බ්‍රහ්මණයන්, යුවලක් එකට බන්දා ඔවුන්ව කාම චිතකය මත ඉන්දවයි. ඔය සත්‍ය බ්‍රහ්මණයන්, ඔවුන්ව දැන් කාම චිතකයෙන් ඉවතට ගෙන ඔවුන්ව ඥාන චිතකයේ අසුන් ගැනීමේ බන්දනයෙන් බැඳ දමයි. එබැවින් ඔවුන් අනෙක් බන්දනය අත්හල යුතුයි. මෙහි දරුවන් සණ්ඩු සරුවල් කර ඔවුන්ගේ සියළු මුදල් අපතේ හරියි. මෙකල, ලෝකයේ බොහෝ අපද්‍රව්‍ය තිබේ. නරකම රෝගය වන්නේ සිනමාවයි. සිනමාවට යැමෙන් හොඳ දරුවන් පවා නරක් වෙයි. එබැවින් බීකේවරුන්ටද සිනමාවට යැම තහනම් කර තිබේ. කෙසේවෙතත් ශක්තිමත් අයට බාබා පවසන්නේ එහිදීද සේවය කරන්න. එම සිනමාව සීමිත බව, ඔවුන්ට විස්තර කර දෙන්න. අසීමිත සිනමාවක්ද තිබේ. එම සීමිත සහ ව්‍යාජ සිනමාව ඇරඹුනේ අසීමිත සිනමාවෙන්ය. සියළුම ජීවාත්ම වාසය කරන ජීව ලෝකය එය බවත්, එහෙ සහ මෙහෙ අතර, සූක්ෂ්ම ලෝකය තිබෙන බවත්, පරම පියා ඔය දරුවන්ට දැන් විස්තර කර දී තිබේ. මුළු නාටකයම සිදුවන භෞතික ලෝකය මෙයයි. මෙම චක්‍රය නොකඩවා බ්‍රමණය වෙයි. ඔය බ්‍රහ්මණ දරුවන් ස්ව දර්ශන චක්‍රදාරීන් විය යුතුයි. මෙය විය යුත්තේ දේවතාවන් නොවෙයි. කෙසේවෙතත් ඔවුන් උත්සාහ දරන්නන් නිසා, බ්‍රහ්මණයන්ට මෙම සංකේත ලබා දී නැහැ. අද, ඔවුන් හොඳින් ගමන් කරමින් සිටියි. හෙට ඔවුන් ඇද වැටෙයි. මෙම සංකේත, දේවතාවන්ට ලබා දෙන්නේ මේ නිසයි. ශ්‍රී ක්‍රිෂ්ණා, චක්‍රයකින් අකාසූර්, බකාසූර් ආදීන් මරා දමන ආකාරය ඔවුන් පෙන්වයි. කෙසේවෙතත් ඔහුට අවිහිංසාවේ උසස්ම ධර්මය ඇති බව කියයි, එසේ නම් ඔහු කිසිවෙකු මරන්නේ කෙසේද? ඒ සියල්ල භක්තියේ මෙවලම්ය. ඔබ කොහේ ගියත් ශිවාගේ ඕවලාකාර ප්‍රතිමාවක් (ලිංගමයක්) තිබෙයි. බොහෝ විවිධ නම් ලබා දී තිබේ. ඔවුන් වලින් බොහෝ දේවතාවන් සාදයි. ඔවුන් ඒවා සරසයි. ඔවුන් ඒවාට රුපියල් දහස් ගණනක් වියදම් කරයි. ඔවුන් ඒවා නිර්මාණය කර, වන්දනා කර, රැකගෙන, ඉන්පසුව ජලයේ ගිල්වයි! ඔවුන් බෝනික්කන්ගේ වන්දනාවට බොහෝ මුදල් වැය කරයි. ඔවුන්ට ඉන් කිසිම ඵලක් අත් වන්නේ නැත. පරම පියා විස්තර කරන්නේ ඒ සියළුම භක්තිය, මුදල් අපතේ හැරීම වෙනුවෙන්ය. ඔවුන් අඛන්ඩව ඉනිමග දිගේ පහලට ඇවිත් තිබේ. පරම පියා පැමිණි විට, එය සියළු දෙනාටම ඉහල නැගීමේ අවස්ථාව වෙයි. ඔහු ඔබ සියළු දෙනාවම සාම දේශයට සහ සතුටු දේශයට ගෙන යයි. මෙහි මුදල් අපතේ හැරීම පිලිබඳ ප්‍රශ්නයක් නැහැ. භක්ති මාර්ගයේ මුදල් අපතේ යැවීමෙන් ඔබ දූප්පත් විය. පරම පියා මෙහි අසුන්ගෙන ධනවත් වීම සහ දූප්පත් වීම පිලිබඳ කතා පුවත විස්තර කර දෙයි. ඔබ ලක්ෂ්මී සහ නාරායන්ගේ මෙම රජ පෙලපතට අයත්ව සිටියා නේද? පරම පියා ඔබව සාමාන්‍ය මනුෂ්‍යයන්ගෙන් නාරායන් බවට පත් වීමට ඔබට දැන් ඉගැන්වීම් ලබා දෙයි. ඒ මිනිසුන් අමරණීයත්වයේ කතා පුවත සහ තෙවැනි ඇසේ කතා පුවත පවසන නමුත් ඒ සියල්ල මුසාවන්ය. සෑම ජීවාත්මයකගේම ඥානයේ තෙවැනි ඇස විවර වන තෙවැනි ඇසේ කතා පුවත මෙයයි. මුළු චක්‍රයම බුද්ධියට ඇතුළු වෙයි. ඔය සෑම කෙනෙකුටම ඥානයේ තෙවැනි ඇසක් හිමි වනවා. ඔබ අමරණීයත්වයේ කතා පුවතටද සවන් දෙනවා. අමරණීය බාබා, ඔබට අමරණීයත්වයේ කතා පුවත පවසනවා. ඔහු ඔබව අමරණීය දේශයේ අධිපතියන් බවට පත් කරනවා. එහිදි ඔබ කිසිදා මරණය අත්දකින්නේ නැත. මිනිසුන් තුල මරණයට බොහෝ සේ බියක් තිබේ. එහිදි, මරණයට බියක් හෝ හඬා වැලපීම නොමැත. ඔබගේ පරණ සිරුර ඔබ සතුටින් හැර ගොස් අළුත් එකක් ගනී. මෙහි මිනිසුන් බොහෝ හඬා වැලපෙයි මෙය කඳුළු ලෝකයයි. පරම පියා පවසන්නේ මෙම නාටකය කල්තියා නියමිත වූවක්. සෑම කෙනෙක්ම තමන්ටම අයත් චරිත කොටස රඟදක්වනවා. දේවතාවන් බැඳීම් ජයගත් අයයි. ලෝකයේ අනේක ගුරුන් සිටින අතර ඔවුන් සියළු දෙනාටම විවිධ අදහස් තිබේ. එක් එක්කෙනාගේ අදහස ඔහුටම අයත් එකකි. මෙහි, තෘප්තියේ දේවතාවියක්ව වන්දනා කරයි. තෘප්තියේ දේවතාවන්ට පැවතිය හැක්කේ ස්වර්ණමය යුගයේ පමණයි. ඔවුන් මෙහි වෙසෙන්නේ කෙසේද? ස්වර්ණමය යුගයේ දේවතාවන් සෑම විටම සිටින්නේ තෘප්තිමත්වයි. මෙහි සෑම කෙනෙකුටම එක හෝ තව ආශාවක් තිබේ. එහි ආශා නොමැත. පරම පියා සියළු දෙනාව තෘප්තිමත් බවට පත් කරයි. ඔබ කෝටිපතියන් බවට පත් වෙයි. නොලැබීම් කිසිවක් එහි නොමැති නිසා, කිසිම දෙයක් ලබා ගැනීම පිලිබඳ කණස්සල්ලක් එහි නැත. එහි කණස්සලූ නැත. පරම පියා පවසන්නේ මා සියළු දෙනාට මුක්තිය පිරිණමන්නාය. ඔය දරුවන්ට උපත් 21 කට සතුට ලබා දෙනවා. ඔබ එවන්

පියෙක්ව සිහි කල යුතුයි. ඔබගේ පාපයන් පිලිස්සී ගොස් ඔබ සතෝප්‍රධාන් වන්නේ ඔහුව සිහි කිරීමෙන්ය. මේ දේවල් වටහා ගත යුතුයි. ඔබ අන් අයට විස්තර කර දෙන තරමට, ඔබ උසස් තත්ත්වයක් හිමි කරගෙන ඔබගේ පුරවැසියන් නිර්මාණය වෙයි. ඔබට යම් කිසි සාදූ කෙනෙක් ආදිය ගැන කතා පුවතක් කියන්නේ නැත. පරමාත්ම දෙවියන් මෙහි අසුන්ගෙන මේ කෙනාගේ මුඛය තුලින් විස්තර කරනවා. ඔබ දැන් තෘප්තියේ දේවතාවන් බවට පත් වනවා. ඔබ පිවිතුරු ලෝකයට යා යුතු නිසා ඔබ සදාකාලයටම පිවිතුරුව රැඳී සිටීමටද දැන් භාරයක් විය යුතුයි. එබැවින් අපවිත්‍ර නොවන්න. පරම පියා ඔබට මෙම භාරය උගන්වා තිබේ. මනුෂ්‍යයන් දැන් විවිධ අන්දමේ උපවාස සිදු කරයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඒකායන පියාගේ උපදෙස් පිළිපැද නිරන්තරයෙන් තෘප්තිමත් වී, තෘප්තියේ දේවතාවන් වන්න. මෙහිදි කිසිම ආශාවන් තබා නොගන්න. පරම පියාගෙන් සියලු ලැබීම් හිමි කරගෙන කෝටිපතියන් වන්න.
2. සිනමාව ඔබව බොහෝ කිලිටි කරයි. ඔබට චිත්‍රපටි නැරඹීමට අවසර නැත. ඔබ නිර්භීත නම් සහ අසීමිත සිනමාව සහ සීමිත සිනමාව අතර වැදගත්කම ඔබට වටහාගැනීමට හැකි නම්, එය විස්තර කිරීමෙන් ඔබට සේවය කළ හැක.

**වරදානය:** ඔබ විනයගරුක, දැඩි උත්සාහවන්තයෙකු වී ඔබේ උත්සාහයන් හා සේවයේ වර්ධනයක් ලබා ගනිත්වා.

බ්‍රාහ්මණවරයෙකු යනු විනයගරුක ජීවිතයක් ඇති අයෙකි. කාර්යයක් නිවැරදි ආකාරයෙන් සිදු කරන විට සාර්ථක වේ. ඕනෑම අවස්ථාවක, ඔබේ උත්සාහයන් හෝ සේවයේ කිසිදු වර්ධනයක් නොමැති නම්, ඔබ එය කරන ආකාරයේ යමක් නිසැකවම අඩු වී ඇත. එබැවින්, පරීක්ෂා කරන්න: අම්රිත් වේලාවේ සිට රාත්‍රිය දක්වා, මගේ සිතිවිලි, වචන, ක්‍රියා සහ සම්බන්ධතා විනයගරුක වූවාද, එනම්, වර්ධනයක් තිබුණාද? එසේ නොතිබුනේ නම්, එයට හේතුව කුමක්දැයි සිතා එයට විසඳුමක් සොයා ගන්න, එවිට ඔබ අධෛර්යමත් නොවනු ඇත. ඔබේ ජීවිතය විනයගරුක නම්, නිසැකවම වර්ධනයක් ඇති වන අතර ඔබ දැඩි උත්සාහවන්තයෙකු බවට පත්වනු ඇත.

**පාඨය:** පිරිසිදුකමෙන් හා අවංකභාවයෙන් පිරී සිටීම යනු සැබෑ පාරිශුද්ධත්වය තිබීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගාවේ බලයන්ගෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබට වචන වලින් කාර්යයක් කිරීමට නොහැකි වූ විට, මෙසේ කියනු ලැබේ: "මේ තැනැත්තා වචන වලින් තේරුම් නොගනු ඇත, නමුත් පරිවර්තනය සිදුවන්නේ සුබ පැතුම් වලිනි." වචන වලට කාර්යයක් ඉටු කිරීමට නොහැකි වූ විට, නිශ්ශබ්දතාවයේ බලයේ උපකරණ - ඒවා ඔබේ සුබ පැතුම්, පිරිසිදු හැඟීම්, ඔබේ ඇස්වල භාෂාවෙන් දයාව - සහ ඔවුන් අත්විඳින සෙනෙහස - එය ළඟා කර ගැනීමට හැකි වනු ඇත.